# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம

පොදු කාරයාලය :011-2868441, 2868442, 2868443
பொதுஅலுவலகம்

ෆැක්ස්/தொலைநகல:011-2868426
***web :www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk***

මැතිවරණ මහලේකම්කාර්යාලය
සරණ මාවත, රාජගිරිය(10107)

தேர்தல்கள் செயலகம்,
சரணமாவத்தை, இராஜகிரிய(10107)


මගේඅංකය : DE/LI/04/2015 Vehicle
எனது இல.

ඔබේඅංකය :
உமது இல.

දිනය : 2015.08.05
திகதி

**ඉතා හදිසි**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරු වෙත,**
**සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරු වෙත,**

**<u>පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015</u>**

**<u>රජයේ වාහන පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම.</u>**

2015.08.17 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනයට රජයේ වාහන අයුතු ලෙස යොදා ගැනීම වැළැක්වීම පිණිස මවිසින් වරින් වර නිකුත් කර ඇති විධාන චක්‍රලේඛ, උපදෙස්වලට පටහැනිව මැතිවරණයට තරඟ කරන අපෙක්ෂකයන් වන අමාත්‍යවරු/නියෝජ්‍ය අමාත්‍යවරු/රාජ්‍ය අමාත්‍යවරු/හිටපු මන්ත්‍රීවරු හා පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරු/මන්ත්‍රීවරු මේ වන විටත් රජය සතු වාහන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට අයථා ලෙස යොදා ගන්නා බවට දිගින් දිගටම මා වෙත පැමිණිලි ලැබෙමින් පවතී.

02. අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු, කථානායකවරයා, විපක්ෂ නායකවරයා හැර හත්වන පාර්ලිමේන්තුව නියෝජනය කළ හිටපු මන්ත්‍රීවරුන් වෙත ජනාධිපති ලේකම්ගේ SP/SB/2/15 හා 2015.02.05 දිනැති චක්‍රලේඛය යටතේ නිකුත් කර තිබූ සියලුම රජයේ වාහන ආපසු භාරදිය යුතු බවට ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සීඑස්/ඒ/1/1/92 හා 2015.07.17 දිනැති චක්‍රලේඛයෙන් කරන ලද නියම හා ඒ පිළිබඳව මවිසින් නිකුත් කරන ලද උපදෙස් අනුව භාරදිය යුතුව තිබූ එහෙත් තවමත් ආපසු භාර දී නොමැති වාහන පිළිබඳව තොරතුරු මෙන්ම එකී චක්‍රලේඛ/ උපදෙස්වලට අනුව අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ආපසු භාරදිය යුතු වාහන තවමත් භාර දී නොමැති නම් එවැනි වාහන පිළිබඳ තොරතුරු ද රැස්කර ගැනීමට අවශ්‍ය වී තිබේ.

03. එබැවින් මේ පිළිබඳව පුවත්පත් දැන්වීමක් පළ කොට මෙතෙක් භාර නොදුන් වාහන පොලිස් අත් අඩංගුවට ගෙන නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට අපේක්ෂා කරන හෙයින් මේ දක්වා භාර නොදුන් සියලුම වාහනවල විස්තර මේ සමග අමුණා තිබෙන ආකෘතියට අනුව සකස් කොට 2015.08.07 වන සිකුරාදා පැය 1200ට පෙර 0112868445/ 0112868448 දරන ෆැක්ස් අංකවලට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. තව ද අමාත්‍ය මණ්ඩලය නියෝජනය කරන අමාත්‍යවරුන් හා වෙනත් අමාත්‍යවරුන් විසින් භාවිතා කරන වාහනවල අංක ද දන්වා එවිය යුතු අතර අමාත්‍යවරුන්/ රාජ්‍ය අමාත්‍යවරුන්/ නියෝජ්‍ය අමාත්‍යවරුන් එම වාහන ස්වකීය නිල රාජකාරිවලට අමතරව පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නේ නම් ඒ සඳහා එක් වාහනයකට රුපියල් ලක්ෂ

තුනක් (භාවිතා කළ හැකි උපරිම වාහන සංඛ්‍යාව 3කි) ගෙවා තිබේ ද යන්න ද ඒ සමඟ දැන්වීම අත්‍යවශ්‍යය.

05. එසේම මෙම වාහන ආපසු භාර දීමට කටයුතු නොකරන්නේ නම් රාජ්‍ය දේපළ අයුතු පරිහරණය යටතේ නීතයානුකූලව පියවර ගැනීමට සිදු වන බව අදාළ වාහන භාවිතා කරන සියලුදෙනා වෙත හා වාහන විෂය භාර නිලධාරීයා වෙත දැන්විය යුතු බවත්, රාජ්‍ය දේපළ අයුතු පරිහරණය වැළැක්වීමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරී ඇති පැහැර හැරිය නොහැකි වගකීමක් බවත්, අවධාරණය කරනු රිසියෙමි.

06. රජයේ දේපළ අවභාවිතය වැළැක්වීම සඳහා රජයේ නිලධාරීන් වෙත මවිසින් නිකුත් කරන ලද විධාන ඇතුළත් 1923/4 හා 2015 ජුලි 13 දිනැතිව නිකුත් කරන ලද ගැසට් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර එපරිදි ක්‍රියාකිරීමට රජයේ නිලධරයකු වශයෙන් ඔබ වගකීමට බැඳී සිටින බැවින් ඉහත තොරතුරු නියමිත දිනට පෙර මා වෙත ලැබීමට සැලැස්වීමට ක්‍රියා කළ යුතුය.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත:

අතිරේක ලේකම්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

දැන ගැනීම පිණිස හා මෙම තොරතුරු කඩිනමින් එවීමේ කාර්යය සම්බන්ධීකරණය කිරීම් වස්.